# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

**06 ශ්‍රේණිය** **නැටුම් (දේශීය)** **කාලය පැය 02**

**නම : ...............................................................** **පාසල :........................................................**

<u>සැලකිය යුතුයි</u>

- **I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න තෝරා ගත යුත්තේ ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අනුවය.**

## I කොටස

- A කොටසට සමීප සම්බන්ධතාවයක් දක්වන වචන බන්ධය B කොටසින් තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| 1) විකල්ප වාද්‍ය භාණ්ඩයකි. | මිදුල වටේ අතුගාගෙන යන කලට |
| 2) රබන් පදයක් වේ. | මල් පිපෙයි දෙනෙත් ඇරෙයි |
| 3) මේවර කවි පදයකි. | දවුල |
| 4) පරිසරය හා සම්බන්ධ ගීතයකි. | ටින් බෙරය |
| 5) සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩයකි. | හම්බන් වැල්ලෙන් මාළුත් අරගෙන |

- නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

( ප්‍රකාශන , හස්ත , නත්තල් , දණ්ඩි කඳ , වෙසක් , තෛපොංගල් , කළගෙඩි , ලී කෙළි )

6) පා සරඹ පුහුණු වීම සඳහා අතීතයේදී .................................................. භාවිතා කර ඇත.

7) ආධුනික නර්තන ශිල්පියෙකු ගොඩ සරඹ / ඉලංගම් සරඹ නර්තනයේ දී .......................................... චලන නිවැරදිව හැසිරවීම වැදගත් වේ.

8) බෞද්ධ ජනතාවගේ ආගමික උත්සවයක් ලෙස .................................................. උත්සවය හැඳින්විය හැකිය.

9) කෝලම් රටා දක්නට ලැබෙන්නේ .................................................. උත්සවයේදීය.

10) .................................................. කාන්තාවන්ට ආවේණික ලාස්‍ය නර්තන අංගයකි.

- ගැලපෙන පිළිතුර තෝරන්න.

11) චෙම්බු හා කෝලාට්ටම් යන ද්‍රවිඩ ගැමි නැටුම් වලට සමාන සිංහල ගැමි නැටුම් වේ.

කළ ගෙඩි හා ලී / ගොයම් හා කුළු

12) විකල්ප වාද්‍ය භාණ්ඩයක් නොවන්නේ

ථිං බෙරය / රබාන

13) තිත වාදනය කිරීම සඳහා යොදා ගන්නා ප්‍රධාන වාද්‍ය භාණ්ඩයකි.

තාලම්පට / පන්තේරුව

14) ගමේ පන්සල හා සම්බන්ධ වන්නේ,

කඨින පෙරහැර / වේල් පෙරහැර

15) ගැමියන් විසින් නිර්මාණය කරන ලද නැටුම් වේ.

ශාස්ත්‍රීය නැටුම් / ගැමි නැටුම්

- ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය තෝරා ගෙන අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**උඩරට සම්ප්‍රදාය**

16) උඩරට නර්තන සම්ප්‍රදායේ ගොඩ සරඹ අවසන් කරන පදය .................................................. නමින් හැඳින්වේ.

17) "ගිරෙන් ගිරට පැන ලැගුම් සොයා" .................................................. වන්නමට අයත් කවි පදයකි.

18) උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය .................................................. වේ.

19) "කුඳ ගත ගත දොං" මෙම බෙර පදය ...................................................... තිතට වාදනය කරයි.

20) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය ...................................................... නම් වේ.

**පහතරට සම්ප්‍රදාය**

16) පහතරට නර්තන සම්ප්‍රදායේ ඉලංගම් සරඹ අවසන් කරන පදය .................................................. නමින් හැඳින්වේ.

17) "සතරකිනේ අත් අකුසෙඳිනේ දිලි" .................................................. සිංදු වන්නමට අයත් කවි පදයකි.

18) පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය .................................................. වේ.

19) "ගතිකිට ගත දොම් ගුඳිකිට ගත දොම්" මෙම බෙර පදය ...................................................... තිතට වාදනය කරයි.

20) පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය ...................................................... නම් වේ.

## II කොටස

- ❖ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- ❖ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

(01)

i) උඩරට බෙරය / පහතරට බෙරය හඳුන්වන තවත් නමක් ලියන්න.

ii) ඔබ දන්නා නැලවිලි ගීයක් ලියන්න.

iii) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායේ නමස්කාර සරඹය ලියන්න.

iv) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් පා සරඹ හමාර පදය ලියන්න.

v) විකල්ප වාද්‍ය භාණ්ඩ දෙකක් (2ක්) නම් කරන්න. (ලකුණු 2×5=10)

(02) A , B කොටස් අතුරින් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

A

i) උඩරට නර්තන සම්ප්‍රදායෙහි හනුමා වන්නමට අයත් තිත් රූපය නම් කරන්න. (ලකුණු 02)

ii) එම වන්නමට අදාල බෙර පදය ලියන්න. (ලකුණු 03)

iii) එම වන්නමට අදාල කස්තිරම ලියන්න. (ලකුණු 05)

B

i) පහතරට නර්තන සම්ප්‍රදායෙහි හනුමන්තා තාලය සිංදු වන්නමට අයත් තිත් රූපය නම් කරන්න. (ලකුණු 02)

ii) එම වන්නමට අදාල බෙර පදය ලියන්න. (ලකුණු 03)

iii) එම වන්නමට අදාල ඉරට්ටිය ලියන්න. (ලකුණු 05)

(03)

i) ඔබ දන්නා ගැමි නැටුම් හතරක් නම් කරන්න. (ලකුණු 02)

ii) ඉන් ගැමි නැටුම් දෙකකට අයත් කවිය බැගින් ලියන්න. (ලකුණු 04)

iii) ගැමි නැටුම් වලදී යොදා ගන්නා රංග උපකරණ හතරක් නම් කරන්න. (ලකුණු 04)

(04)

i) ද්‍රවිඩ ගැමි නැටුම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii) සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් වල දැකිය හැකි සමාන අසමානතා ලියන්න. (ලකුණු 04)

iii) ද්‍රවිඩ ගැමි නැටුම් නැරඹිය හැකි අවස්ථා සඳහන් කරන්න. (ලකුණු 04)